**ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභා කාර්යාලය**
**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

මුදල් කොමිෂන් සභා කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය නොකල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභා කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම්

මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභා කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මුදල් කොමිෂන් සභා කාර්යාලයේ ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) කොමිෂන් සභා කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 13.6 වන උප වගන්තිය | මාස 12 ක කාලපරිච්ඡේදයක් තුල උත්සව අත්තිකාරම් ලබාදිය යුත්තේ එක් වරක් පමණක් වන නමුත් නිලධාරියෙකු හට 2018 පෙබරවාරි මස 02 වන දින හා 2018 දෙසැම්බර් මස 18 වන දින රු.10,000 බැගින් අවස්ථා දෙකකදී උත්සව අත්තිකාරම් ලබාදී තිබුණි. | මාස 12 ක කාලපරිච්ඡේද යක් තුල උත්සව අත්තිකාරම් ලබාදිය යුත්තේ එක් වරක් පමණක් වීම. | මෙලෙස එක් වර්ෂයක් තුල දෙවතාවක් උත්සව අත්තිකාරම් ලබා දී ඇත්තේ අතපසු වීමකින් බවත්, මෙවැනි අතපසු වීම් ඉදිරියේදී ඇති නොවන ලෙස කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කල බවත් කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 6.2.2 ඡේදය | ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දියයුතු අවම කාලසීමාව දින 21 ක් විය යුතු වුවත් කොමිෂන් සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා මගී සෝපාන 02 ක් හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය සඳහා වටිනාකම පිළිවෙලින් රු.මිලියන 8 ක් හා 3 ක් ප්‍රසම්පාදනයන්ට අදාළව ලංසු කැඳවීම සඳහා දින 15 ක් පමණක් ලබාදී තිබුණි. | ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දියයුතු අවම කාලසීමාව දින 21 ක් විය යුතු වීම. | මූලික කටයුතු අවසන් කල පසු නව කාර්යාල ගොඩනැගිල්ලට අත්‍යවශ්‍ය භාණ්ඩ වන විදුලි සෝපානය හා STP පද්ධතිය ඉතා ඉක්මනින් ස්ථාපිත කිරීමට අවශ්‍ය වූ බැවින් දින 15 ක කාලයක් ලබා දී ඇත. මෙවැනි අඩුපාඩු මගහරවා ගෙන කටයුතු කරන ලෙස |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නිලධාරීන් දැනුවත් කරන ලදී. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>----------------<br>2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබූ අවස්ථා පහත පරිදි වේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය |
| | | (i) සමස්ථ කාර්ය මණ්ඩලයේ නිශ්චිතව පැවතුණු වගකීම්වලට අදාලව පවතින නිපුණතා සහ රාජකාරි සාර්ථකත්වය සඳහා පැවතිය යුතු නිපුණතා අතර පරතරය හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. | | (i) වැඩ අධ්‍යනයක් කිරීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කර ඇත. |
| | | (ii) නිපුණතා පරතරය අවම කිරිම සඳහා ආයතනයට සුවිශේෂී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබීම. | | (ii) මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කරමින් පවතී. |
| | | (iii) මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික විය යුතුය. 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 85 ක් වූ නමුත් තථ්‍ය ස්ථිර කාර්ය මණ්ඩලය සාමාජිකයින් 52 ක ගෙන් සමන්විත වූ අතර, මුළු කාර්ය මණ්ඩලයෙන් 2018 වර්ෂය තුලදී පුහුණු අවස්ථා ලබාදීම 07 දෙනෙකුට පමණක් එනම් සියයට 13 කට පමණක් සීමා වී තිබුණි. | | (iii) 2019 වර්ෂයේදී මේ පිලිබදව අවධානය යොමු කර කටයුතු කිරීමට සටහන් කර ගන්න ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන වෙනත් ලැබීම් යටතේ වෙනත් ආයතන වෙනුවෙන් කොමිෂන් සභා කාර්යාලය විසින් රැස්කරන ලද තත්‍ය ශේෂය වූ රු.13,208,297 ක් වෙනුවට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.13,135,043 ක් ලෙස රු.73,254 ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | තත්‍ය නිවැරදි තොරතුරු ගිණුම් ප්‍රකාශයන් වලට ඇතුලත් කිරීම කල යුතු වේ. | අදායම් සංකේත 20.03.99 යටතේ එක්රැස් කරන ලද රු.73,254 ක මුදල අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශනයේ ACA-01 ආකෘති පත්‍රයට ඇතුලත් වී නොමැත. එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයයන් දෙකක් සඳහා අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුල සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.288,600,000 කින් වර්ෂය තුල රු.195,252,687 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය රු.93,347,313 ක් විය. එය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 කි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදි වන පරිදි පිළියෙල කල යුතුය. | කාර්යාලයේ වාහන අලුත්වැඩියා කටයුතු දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ ගරාජයෙන් ඉටුකර ගැනීමත් ප්‍රධාන ගණයේ අලුත්වැඩියා කටයුතු සිදු නොවීමත් නිසා එක් වැය විෂයයකද, කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ගෙවීම් කටයුතු සඳහා රු.මි.82.8 ක බිල්පත් ඉදිරිපත් කර තිබූ නමුත්, භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම නිසා අනෙක් වැය විෂයයයේද ප්‍රතිපාදන ඉතිරි විය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභා කාර්යාලයේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පහත පරිදි විය. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 6 ක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 17 ක් ද සහිතව පුරප්පාඩු 33 ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ අවශ්‍ය නොවන්නේ නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝදනය කිරීමට හෝ අපොහොසත් වී තිබුණි. | අදාල පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කල යුතුයි. | පිළිගනිමි . පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් පත්කර එවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් වරින් වර ඉල්ලා සිටියද, සියලු පුරප්පාඩු සම්පූර්ණ වී නොමැත.<br>සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා රජයේ කාර්යාල වල එම දැන්වීම් පල කිරීම සිදු කලද තනතුරු සඳහා ප්‍රමාණවත් නිලධාරීන් ලබා ගැනීමට නොහැකි විය. |